# කුකුළු පැංචාගේ ලෝකය



ජනීසා මින්දුලි හේරත්

# කැකුළු පැංචාගේ ලෝකය

ජනීසා මින්දුලි හේරත්

කුකුළු පැංචාගේ ලෝකය

---

© ජනීසා මින්දුලි හේරත්
මහාමායා බාලිකා විදුහල
1 ශ්‍රේණිය D
2025.02.08

ISBN 978 - 624 - 208 - 583- 8

# පිදුම

*මා හට අකුරු කියාදී*

*යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට*

*ආදරයෙන්*

*පුදමි.*

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.

කුකුළ් අම්මාත් නිදි. කුකුළ් තාත්තාත් නිදි.උදයම කුකුළ් අම්මා ඇහැරලා බිත්තර දැම්මා. කුකුළ් අම්මා බිත්තර උඩ හරිම පරිස්සමට එයාගේ අත්තටු වලින් බිත්තර රකිනවා මම දැක්කා.



ටික දවසකට පසු බිත්තර වලින් පුංචි පැටවු එළියට ආවා. කුකුළ් අම්මාට හරිම සතුටුයි. අනේ මගේ පැටවු එලියට ඇවිත්... කුකුළ් අම්මා සතුටින් කීවා.



අපිට වගේ නෙමෙයි.පුංචි කුකුළ් පැටවුන්ට ඉපදුන ගමන්ම එයාලගේ පුංචි කකුල් වලින් වේගයෙන් දුවන්නත් පුංචි හොටෙන් කීචි බිචි ගාලා කෑ ගසන්නත් පුළුවන්



අහසේ තිබෙන ලොකු එලියක් දැකපු පංචි පැටවු හොඳටම බය වුණා. අම්මේ මේ මොකක්ද? කකුළ් පැටවු ඇහුවා. ඒ තමයි පුතේ ඉර මාමා . එයා තමයි මේ ලෝකයට එළිය දෙන්නේ ගස් වලට කොළ පාට දෙන්නෙත්, ලස්සනට මල් පිපෙන්නත් ඉර මාමාගේ එළිය නිසයි.



කුකුළ් අම්මා පුංචි පැටවුන්ට කියලා දුන්නා. පුංචි පැටවු ටික හරිම සතුටින් ලස්සන මල් බලමින් කුරුල්ලන්ගේ මිහිරි ශබ්ද අසමින් දවස ගත කළා.



ඊළඟ දවසෙත් කුකුළ් අම්මා පැටවු සමඟ ඇවිදින්න පිටත් වුණා. පුංචි පැටවුන්ට හිතුණා එයාලා දැන් ගොඩක් ලොයි කියලා. එයාලා තනියම ඈතට ඈතට ගියා.



බුහ්... බුහ්....

කවුද ඒ ?

අනේ මට නම් බයයි.

මටත් බයයි.

අපි අම්මා ගාවට දුවමු.

කුකුළ් පැටවු එකිනෙකාට කියා ගත්තා.

අම්මා... අම්මා...

කියමින් කුකුළ් පැටවු කෑගැසුවා.

අපේ පස්සෙන් කවුදෝ එනවා. අපි හොඳටම බයවුණා.

කුකුළ් පැටවු අම්මාට කිවුවා.

අනේ මගේ දරුවනේ..

ඔයාලා කොහෙද ගියේ?

මම හැම තැනම හොයනවා . මම නැතින තනියම කොහෙයවත් යන්න එපා . ඔයාලගේ පස්සෙන් ඇවිත් තියෙන්නේ උඩහා ගෙදර මාමලාගේ දඩෝරියා.

උගට අහු වුනොත් ඔයාලාව එක කටට කාලා දායි. මම නැතිව ආයෙනම් කොහෙවත් යන්න එපා. කුකුළ් අම්මා ඇගේ පැටවුන්ට අවවාද කළා.

හොඳයි. අම්මා අපිට සමාවෙන්න. අපි ආයේ කවදාවත් අම්මා නැතුව කොහේවත් යන්නේ නෑ. කියමින් කුකුළ් පැටවු අම්මාගේ තටු ඇතුළට ගුලි වුණා.




ටික  දවසකට පස්සේ  පැටවුන්ට කෑම හොයාගන්න හැටි කියලා දෙන්න ඕන කියලා කුකුළ් අම්මාට හිතුණා. එහෙම හිතපු කුකුළ් අම්මා එයාගේ පැටවු ටිකත් අරන් වත්ත පහළට ගියා. ඔහොම යනකොට පොඩි ගැඩවිල් පණුවෙක් හම්බවුණා. පැටවු ටික එයාව වට කරගෙන කොටන්න පටන් ගත්තා. පණු පැටියාට රිදෙන්න ඇති. ඒත් ඒක කුකුළ් පැටවුන්ගේ කෑමක්නේ...

බිම තිබෙන පුංචි ඇට වර්ග අහුලාගෙන කන හැටිත් කුකුළ් අම්මා පැටවුන්ට කියලා දුන්නා.



දැන් කුකුළ් පැටවු ටිකකක් ලොකුයි. අනේ මගේ පුංචි පැටවු ඉක්මනට ලොකු වෙලා කියලා කුකුළ් අම්මා හරිම සතුටින් පැටවු දිහා බලාගෙන හිටියා. හරියට පුංචි අපි හොඳ ළමයි විදිහට ලොකු වෙන හැටි බලමින් අපේ අම්මායි අප්පච්චියි සතුටු වෙනවා වගේ





# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්